**ජපාන තානාපති කාර්යාලය**

From the People of Japan

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7, ශ්‍රී ලංකාව
දු.කඃ +94-11-2693831~3, ෆැක්ස්ඃ +94-11-2698629
විද්‍යුත් තැපැලඃ cultujpn@sltnet.lk

**මාධ්‍ය නිවේදනය**

2014 පෙබරවාරි 00

# ජපාන රාජ්‍ය නොවන සංවිධානය ශ්‍රී ලංකාවේ ප්‍රජා මූල ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ධාරිතා ගොඩනැංවීමේ ව්‍යාපෘතියක් සඳහා අරමුදල් ලබයි

ජපාන තානාපති නොබුහිතෝ හෝබෝ සහ "සිවික් ෆෝස්" (Civic Force) වැඩ සටහන් ඒකක ප්‍රධානී මෙගුමි කුවානා මෙනෙවිය 2014 පෙබරවාරි 12 වන දා කොළඹ පිහිටි තානාපති නිල නිවසේදී "ප්‍රජා මූල ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ ධාරිතා ගොඩනැංවීමේ ව්‍යාපෘතිය" සඳහා අරමුදල් ගිවිසුමකට අත්සන් තැබූහ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො. 291,005 ක් (රු. මිලියන 37ක් පමණ) වන අතර, ජපාන "නිල සංවර්ධන ආධාර ව්‍යාපෘතියේ" (Official Development Assistance – ODA) අරමුදල් සම්පාදන වැඩ සටහනක් වන "ජපාන රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාපෘති සඳහා අරමුදල් සහාය" (Grant Assistance for Japanese NGO Projects) යටතේ වසරක කාලයක් ක්‍රියාත්මක වීමට නියමිත ය. ජපාන ආපදා සහන රාජ්‍ය නොවන සංවිධානයක් වන "සිවික් ෆෝස්" මේ වන විට ඊශාන‍දිග ජපානයේ යළි ගොඩනැගීම් සහ පුනරුත්ථාපන කටයුතුවල නිරතව සිටින අතර පසුගිය කාළයේදී පිලිපීනය සහ තායිලන්තය තුළ ආපදාවලින් පීඩාවට පත් ප්‍රදේශයන්හි හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම් ආදී කටයුතුවල ද නිරත විය.

ශ්‍රී ලංකාව නිරන්තරයෙන් ම ගංවතුර, නාය යාම්, නියඟය වැනි ආපදාවන් සහ විවිධ වූ ගැටුම් වලට මුහුනදෙනු ලබයි. 2004 වසරේදී ඉන්දියානු සාගර සුනාමියෙන් රටේ ග්‍රාමීය ප්‍රදේශ විනාශ වූ අතර, ආපදා කළමනාකරණ ආධාර වල අවශ්‍යතාව මෙන් ම දරිද්‍රතාව සහ විවිධ වූ ගැටුම් වල බලපෑම වැනි එකට බැඳුණු සාධකවලට විසඳුම් සෙවීම සඳහා පුළුල් ප්‍රතිචාරයක අවශ්‍යතාව ද ඉස්මතු කර දැක්වී ය.

මෙම ව්‍යාපෘතිය ආපදා වැළැක්වීම සහ ආපදා කළමනාකරණය සම්බන්ධ දේශීය ප්‍රජා හැකියාවන් වැඩි දියුණු කිරීමට අදහස් කරයි. ව්‍යාපෘතියේ පළමු වසර තුළ කොළඹ සහ ත්‍රිකුණාමලය ප්‍රදේශවල දී හැකියා ගොඩ නැගීමේ වැඩමුළු/පුහුණු සහ ජාලකරණ රැස්වීම් ද ඊට අමතරව ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණයට සම්බන්ධ ප්‍රමුඛ පුද්ගලයන් සඳහා ජාතික පරිමාණ සම්මන්ත්‍රණයක් ද පැවැත්වේ. ව්‍යාපෘතිය ආපදාවලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධ දේශීය ප්‍රජා හැකියාවන් වැඩි දියුණු කරනු ඇතැයි ද අංශ අතර සහයෝගිතාව සහ ප්‍රායෝගික ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් සහභාගිකයන් සතු නිපුණතා ශක්තිමත් කරනු ඇතැයි ද අපේක්ෂිත ය.

කුවානා මෙනෙවිය ව්‍යාපෘතිය පිළිබඳව අදහස් දක්වමින් මෙසේ පැවසුවා යඃ "ආපදා කළමනාකරණය සෑම දෙනා ම පොදුවේ සැලකිලිමත් වන කරුණක් නිසා මේ ව්‍යාපෘතිය සමස්ත ප්‍රජා සංවර්ධනය සඳහා වගේ ම අංශ අතර සහයෝගිතාව සහිතව ප්‍රජා මූල මට්ටමේ සිට මධ්‍යම රජය දක්වා අදහස් ගලා යාමක් ඇති කිරීමටත් හොඳ අවස්ථාවක් වේවි. අපට නොයෙක් ආකාරයේ ආපදාවලින් පීඩාවට පත් වන ශ්‍රී ලංකාව තුළ ආපදා කළමනාකරණය පිළිබඳ ආදර්ශයක් නිර්මාණය කරන්න පුළුවන් වුණොත් ඒක වෙනත් රටවල විශේෂයෙන් ම පැසිෆික් ආසියානු කලාපය තුළ දී ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රයෝජනවත් අත්දැකීමක් බවට පත් වේවි. ජපාන රාජ්‍ය නොවන සංවිධානයක් වන අප ඊශාන‍දිග ජපානයේ සිදු කළ යළි ගොඩ නැගීම් සහ පුනරුත්ථාපන කටයුතුවල පාඩම් ප්‍රයෝජනයට ගැනීමට කැමති යි."

2014 පෙබරවාරි 12 වන දා කොළඹ පිහිටිතානාපති නිල නිවසේදී අරමුදල් ගිවිසුමට අත්සන් තැබීම සිදු වූයේ ජපාන තානාපති ගරු නොබුහිටෝ හෝබෝ මැතිතුමා සහ "සිවික් ෆෝස්" වැඩ සටහන් ඒකක ප්‍රධානී මෙගුමි කුවානා මෙනෙවිය අතර යි.

*　　*　　*

වැඩි දුර තොරතුරු සඳහා විමසන්න
011-2693831~3 (දිගුව 25)

ජපාන තානාපති කාර්යාලයේ ආර්ථික සහයෝගිතා අංශය